රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு

Ministry of Public Administration and Management

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை.

Independence Square, Colombo 07, Sri Lanka.

Website : www.pubad.gov.lk

විමර්ශන, පර්යේෂණ හා මෙහෙයුම් ඒකකය

Investigation, Research and Monitoring Unit

புலனாய்வு,ஆராய்ச்சி மற்றும் வழிகாட்டல் பிரிவு

| දුරකතන | ෆැක්ස් | ඊ-මේල් |
|---|---|---|
| தொலைபேசி: (94) 011-2684223 | தொலைநகல் (94) 011-2683132 | மின்னஞ்சல் sas-investi@pubad.gov.lk |
| Telephone | Fax | E-mail |


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி: / Date |
|---|---|---|
| IRM/Ad/1/4 | | 2016.03.18 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>මාණ්ඩලික මට්ටමේ විමර්ශන නිලධාරි සංචිතයක් පිහිටුවීම.</u>**

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත විමර්ශන, පර්යේෂණ හා මෙහෙයුම් අංශය මගින් මෙම අමාත්‍යාංශයේ හා ඊට අනුබද්ධ ආයතනයන්හී විමර්ශන රාජකාරී වලට අමතරව, කරනු ලබන ඉල්ලීම් අනුව වෙනත් රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය ආයතන වල විමර්ශන කටයුතු දීර්ඝ කාලයක් තිස්සේ ඉටුකරනු ලබයි.

02. තවද දීප ව්‍යාප්ත සේවාවන්හී අධීක්ෂණ හා පරිපාලන බලධාරිත්වයත් රාජ්‍ය සේවා කොමිසම් සභාව විසින් නිකුත් කර ඇති අංක 1941/41 හා 2015-11-20 දිනැති ගැසට් නිවේදනයට අනුව උක්ත සේවාවන්ට අදාළ නිළධරයෙකු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ දෙවන උපලේඛණයට ගැනෙන වැරදි සම්බන්ධව විනය බලධාරිත්වය රාජ්‍ය පරිපාලන ලේකම් වෙත පවරා ඇති අතර, මෙයට පෙර සිටම පළමු උපලේඛණය යටතට ගැනෙන වැරදි සම්බන්ධව විනය තීරණ ගැනීම සම්බන්ධ නිරීක්ෂණ ලබාදීම සිදුකරයි. එමෙන්ම උක්ත ගැසට් නිවේදනය මගින් ඒකාබද්ධ සේවාවන්ට අදාළ විනය බලධාරිත්වය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත පවරා ඇත.

03. රාජ්‍ය සේවයට අදාලව මානව සම්පත් කළමනාකරණය කරන ප්‍රමුඛතම අමාත්‍යාංශය මෙන්ම ප්‍රතිපත්ති සකස් කරන ප්‍රධාන අමාත්‍යාංශයක් ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය තුල ශක්තිමත් මධ්‍යම විමර්ශන ඒකකයක් පවත්වාගෙන යාම රාජ්‍ය සේවයේ යහපාලනය තහවුරු කිරිමට අවැසි වන බව පෙනී ගොස් ඇත.

04. මෙහිදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය තුල විමර්ශන, පර්යේෂණ හා මෙහෙයුම් ඒකකය යටතේ නිලධාරින්ගේ රාජකාරි කටයුතු වලට බාධා නොවන පරිදි මාණ්ඩලික මට්ටමේ විමර්ශන නිලධාරි සංචිතයක් පවත්වාගෙන යාම තුලින් අවශ්‍ය අවස්ථාවන් වලදී දැනටද රාජ්‍ය සේවයේ නියුතු මාණ්ඩලික මට්ටමේ නිලධාරින්ගෙන් සමන්විත මූලික විමර්ශන නිලධාරින් පත්කිරිම වඩාත් යෝග්‍ය බව නිරීක්ෂණය වන අතර, මාණ්ඩලික නිලධාරින්ටද මූලික විමර්ශන ක්‍රියාවලිය පිළිබඳ තම අත්දැකීම් පුළුල් කරගැනීමටද පිටුවහලක් ලැබේ. එසේම මෙම සංචිතයේ නිලධරයෙකු සිදුකරන මූලික විමර්ශනය සඳහා අංක 14/2014 හා 2014-05-03 දිනැති චක්‍රලේඛය මගින් ගෙවීම් කළ හැකි වේ. මෙහිදී මෙම සංචිතයේ ලියාපදිංචි නිලධාරින් සඳහා සංචිතයේ ලියාපදිංචිව සිටින කාලය තුල යම් විනය පරීක්ෂණයක රැකවරණ නිලධාරියෙකු ලෙස කටයුතු කළ නොහැකි බව අවධාරණය කෙරේ.

05. මේ සඳහා කැමැත්තක් හා හැකියාවක් ඇති මාණ්ඩලික මට්ටමේ නිලධාරින් ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ සිටී නම් මේ සමඟ ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර එවීමෙන් මෙම අමාත්‍යාංශයේ විමර්ශන හා පර්යේෂණ හා මෙහෙයුම් ඒකකයේ ලියාපදිංචි විය හැකි බව කාරුණිකව දන්වමි.

මේ සම්බන්ධ වැඩිදුර විමසීම් සඳහා පහත දුරකථන අංකය හා සම්බන්ධ වන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

බී.එම්.එම්.එම්. බස්නායක, අතිරේක ලේකම් (විමර්ශන, පර්යේෂණ හා මෙහෙයුම්)
දුරකථන අංකය 0112676433
විද්‍යුත් තැපැල adsecinv@pubad.gov.lk



ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

## රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

## මාණ්ඩලික මට්ටමේ මූලික විමර්ශන නිලධාරි සංචිතයට බඳවාගැනීම සඳහා අයදුම් පත්‍රය

1. මුලකුරු සමඟ නම: ..........................................................................................................
   මුලකුරු වලින් හැඳින්වෙන නම: ..........................................................................................
2. පෞද්ගලික ලිපිනය: ..........................................................................................................
3. උපන් දිනය: ..........................................................................................................
4. ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................................................
5. පෞද්ගලික දුරකථන අංකය: ..........................................................................................
6. රාජකාරි දුරකථන අංකය: ..........................................................................................
7. විද්‍යුත් ලිපිනය: ..........................................................................................................
8. සේවා තොරතුරු

| අනු අංකය | තනතුර | සේවා ස්ථානය | සේවාව හා ශ්‍රේණිය | පත්වූ දිනය | සේවා කාලය | |
|---|---|---|---|---|---|---|
| | | | | | අවු. | මාස |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

9. මූලික විමර්ශන පැවැත්විය හැකි මාධ්‍ය:-සිංහල/ඉංග්‍රීසි/දෙමළ: ..................................................
10. මූලික විමර්ශන පැවැත්විය හැකි දිස්ත්‍රික්ක/ දිස්ත්‍රික්කය: ..........................................................
11. මූලික විමර්ශන පැවැත්වීම පිළිබඳ පළපුරුද්ද:

| අනු අංකය | විස්තරය | වාර ගණන |
|---|---|---|
| 1. | මූලික විමර්ශන නිලධාරියෙකු ලෙස කටයුතු කිරිම | |
| 2. | පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරියෙකු ලෙස කටයුතු කිරිම | |
| 3. | විනය පරීක්ෂණ වල සාක්ෂිකරුවන් ලෙස කටයුතු කිරිම | |
| 4. | රැකවරණ නිලධාරියෙකු ලෙස කටයුතු කිරිම | |

12. සේවා කාලයේදී යම් විනය දඬුවමක් ලබා තිබේද යන වග: ..................................................
13. ඔබ සම්බන්ධව දැනට මූලික විමර්ශනයක්/විනය පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබේද යන වග:
    ..........................................................................................................

මා මූලික විමර්ශන නිලධාරියෙකු වශයෙන් තෝරාගනු ලැබුවහොත් 1999 නොවැම්බර් 01 වැනි දින සිට බලාත්මක වන ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ ඇති කොන්දේසි ප්‍රකාර හා රජය විසින් වරින්වර පනවන කොන්දේසි අනුව කටයුතු කරන බවට හා නියම කරනු ලබන කාලසීමාව ඇතුළත මගේ වාර්තාව මූලික විමර්ශනයට අදාළ සියළු ලිපි ලේඛන සමඟ අදාළ විනය බලධාරියා වෙත භාරදෙන බවට එකඟ වෙමි.

.......................................... ..............................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**ආයතන ප්‍රධානිගේ නිර්දේශය**

ඉහත නම සඳහන් ................................................................ මයා/මිය/මෙනෙවිය සම්බන්ධයෙන් කිසිදු විනය දඬුවමක් ලබාදී හෝ විනය පරීක්ෂණයක්/මූලික විමර්ශනයක් දැනට නොපැවැත්වෙන බවත්, පැවැත්වීමට යෝජිතව හෝ ඇති/නැති බවත් සහතික කරමි. එසේම මෙම නිලධාරියා ඉහත සංචිතය සඳහා තෝරා ගතහොත් අදාළ දිනයන්හී නිදහස් කළ හැකි/නොහැකි බවද දන්වා සිටින අතර, අයදුම්පත නිර්දේශ කරමි.

දිනය

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

---

## කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

ඉහත නිර්දේශයට එකඟවෙමි/ එකඟනොවෙමි.

..........................................
දිනය

.............................................................
අතිරේක ලේකම්/ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(විමර්ශන, පර්යේෂණ හා මෙහෙයුම් අංශය)

අනුමත කරමි.

.................................................................
ලේකම්
රාජ්‍ය පරිපාලන කළමනාකරණ අමාත්‍යාංශය